කම්කරු දෙපාර්තමේන්තුව මගින් පිරිනමනු ලබන

## කාර්මික සංහිඳියාව සඳහා වන සමාජ කතිකා විශිෂ්ටතා සහතිකය - 2026

කම්කරු දෙපාර්තමේන්තුවේ සමාජ කතිකා හා වැඩපොළ සහයෝගීතා ප්‍රවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන **"කාර්මික සංහිඳියාව සඳහා වන සමාජ කතිකා විශිෂ්ටතා සහතිකය - 2026"** සඳහා වැවිලි අංශය, නිෂ්පාදන අංශය, ඇඟලුම් අංශය සහ සේවා අංශයේ සියලුම සේවායෝජකයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙරට පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශ හා සම්බන්ධ සේව්‍ය - සේවක දෙපාර්ශවය අතර කාර්මික සම්බන්ධතාවය සුරක්ෂිත කර කාර්මික සාමය ඇති කිරීම තුළින් වඩා යහපත් වැඩ පරිසරයක් ගොඩනැංවීමේ අරමුණෙන් මෙම විශිෂ්ටතා සහතිකය නිකුත් කරනු ලබයි. සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතාවයේ පණිවිඩය මෙරට පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයන්ට හඳුන්වා දීමත්, එම ක්‍රමවේදයන් ප්‍රායෝගිකව ක්‍රියාවේ යෙදවීම ඇගයීමට ලක් කිරීමත්, මෙම විශිෂ්ටතා සහතිකය ලබා දීමේ අනෙකුත් අභිමතාර්ථයන් වේ. මෙම විශිෂ්ටතා සහතිකය ලබා ගැනීමට අයදුම් කර ඇගයීම් පත්‍රිකාව පරිශීලනය කිරීමෙන් සුනිසි වැඩ පරිසරයක් ගොඩ නැංවීම සඳහා, සමාජ කතිකා හා වැඩපොළ සහයෝගීතා ක්‍රමවේදයන් පිළිබඳ අවබෝධයක් මෙරට ආයතන වෙත ලබා දීම ද මෙහි තවත් එක් අරමුණකි.

මෙම විශිෂ්ටතා සහතිකය ලබා ගැනීමට අයදුම් කිරීම සඳහා මෙහි I කොටසේ ඇති උපදෙස්වලට අනුව II කොටසේ සඳහන් අයදුම් පත්‍රය හා III කොටසෙහි සඳහන් ඇගයීම් පත්‍රිකාව නිසි පරිදි සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතුය.

ඔබගේ ආයතනය, මූලික අයදුම් පත්‍ර පරීක්ෂාවෙන් අනතුරුව අධීක්ෂණය කිරීම සඳහා තෝරා ගනු ලැබුවහොත් ඒ පිළිබඳව ඔබට දැනුම් දෙනු ලබන අතර අධීක්ෂණ මණ්ඩලය ඔබ ආයතනයට පැමිණෙන දිනයේ දී සේව්‍ය - සේවක දෙපාර්ශවයටම සවන් දීමෙන් ඇගයීම් පත්‍රිකාවේ දක්වා ඇති තොරතුරු තහවුරු කර ගනු ලැබේ. එම ඇගයීමෙන් අනතුරුව ආයතනයේ සමාජ කතිකාව සහ වැඩපොළ සහයෝගීතාවය වඩාත් දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම ද ඔබ වෙත ලබා දෙනු ඇත.

ඔබ ආයතනයේ සේව්‍ය සේවක සම්බන්ධතාවය වඩා තහවුරු කෙරෙන මෙම විශිෂ්ටතා සහතිකය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන ලෙස ඔබට මෙයින් ඇරයුම් කර සිටිමි.

එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව

10.03.2026

එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

**I කොටස**

## අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් මාලාව

1. මෙම තරඟාවලිය වැවිලි, නිෂ්පාදන, සේවා හා ඇඟලුම් යන ප්‍රධාන අංශ 04ක් යටතේ ක්‍රියාත්මක වන අතර එම අංශ 04හි සේවක සංඛ්‍යාව අනුව සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ, මහා පරිමාණ යන අංශ වශයෙන් කාණ්ඩ 12ක් ඔස්සේ අයදුම් පත්‍ර කැඳවනු ඇත.
2. ඔබගේ ආයතනය අයත් කාණ්ඩය සහ පරිමාණය අයදුම් පත්‍රයේ මුල් පිටුවෙහි ඇති වගුවෙහි අදාළ ස්ථානයේ "√" සලකුණක් යොදා සටහන් කරන්න.
3. II කොටසෙහි සඳහන් අයදුම් පත්‍රයේ 01 – 10 දක්වා ඔබ ආයතනය පිළිබඳ සත්‍ය හා නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන්න.
4. 13 වන කරුණට අදාළව ඔබ ආයතනයට පහසුවෙන් ළඟා විය හැකි ආකාරය ඇතුළත් දළ මාර්ග විස්තරයක් ඇතුළත් කරන්න. (අධීක්ෂණ මණ්ඩලය ඔබ ආයතනයට පැමිණීමට අවශ්‍ය බැවින් නිවැරදි සවිස්තරාත්මක මාර්ග විස්තරයක් ඇතුළත් කරන්න.)
5. මෙහි III කොටස මඟින් ඇගයීම් පත්‍රිකාව දක්වා ඇති අතර එය "අ", "ආ", "ඇ" ලෙස කොටස් 03කින් සමන්විතය.
6. "අ" කොටසෙහි ප්‍රධාන මාතෘකා 08 ක් ඔස්සේ ද "ආ" කොටසෙහි ප්‍රධාන මාතෘකා 06ක් ඔස්සේ ද කරුණු විමසා ඇත. "අ" කොටසෙහි එක් එක් කොටස සඳහා ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණයද, "ආ" කොටසෙහි එක් එක් කොටස සඳහා අඩුවන ලකුණු ප්‍රමාණයද ඇගයීම් පත්‍රයේ සටහන් කර ඇත. එම උපදෙස් පරිදි උපරිම ලකුණු සීමාව තුළ ඔබගේ ලකුණු ලබා දීම සිදු කරන්න.
7. අයදුම් පත්‍රයේ "ආ" කොටසෙහි 01 සිට 06 දක්වා විමසා ඇති තොරතුරු සඳහා ඔබ ආයතනයේ ලේඛනවලින් තහවුරු කළ හැකි සත්‍ය තොරතුරු මත පදනම්ව ලකුණු ලබා දීම සිදු කරන්න.
8. සැම විටම අයදුම් පත්‍රයේ සඳහන් තොරතුරුවල නිවැරදිභාවය තහවුරු කිරීම ඔබ සතුය.
9. ඔබ විසින් යොමු කරන ලද අයදුම් පත්‍රය පහත සඳහන් හේතූන් මත පළමු අදියරයෙන්ම මෙම ක්‍රියාවලියෙන් ඉවත්විය හැක.
    a. "ආ" කොටසේ 1:1, 2:1 සිට 2:5 දක්වා, 4:1 සිට 4:3 දක්වා 5:1 සිට 5:3 දක්වා, 6:3 යන ප්‍රශ්නවලට "නැත" යන පිළිතුර ලැබී තිබීම.
    b. "ආ"කොටසේ අසා ඇති ප්‍රශ්නවලට හිමි සමස්ථ ඍණ ලකුණ සංඛ්‍යාව පනහකට වඩා ලබා ගෙන තිබීම.
    c. "ආ" කොටසේ 03 වන නිර්ණායකය යටතේ අසා ඇති ප්‍රශ්නවලට ලකුණු ඍණ තිහකට (-30) වඩා ලබා ගෙන තිබීම.
10. **"කාර්මික සංහිඳියාව සඳහා වන සමාජ කතිකා විශිෂ්ටතා සහතිකය - 2026"** ට සුදුසුකම් ලැබීම සඳහා ඇගයීම් පත්‍රිකාවේ "අ" කොටසෙහි සහ "ආ" කොටසෙහි සමස්ථ ලකුණුවල එකතුව අවම වශයෙන් 80 ක් ලබා තිබිය යුතුය.
11. අයදුම්පත මඟින් ඉදිරිපත් කර ඇති තොරතුරු සනාථ කිරීම සඳහා ඔබ ආයතනය පිළිබඳ සකස් කරන ලද වාර්තාවක් ද සමඟ සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026** අප්‍රේල් මස **17** වන දිනට පෙර E – mail මඟින් හෝ තැපැල් මඟින් පහත සඳහන් ආකාරයට යොමු කරන්න.

කම්කරු කොමසාරිස්
සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ප්‍රවර්ධන අංශය
12 වන මහල, මෙහෙවර පියෙස
කම්කරු දෙපාර්තමේන්තුව
නාරාහේන්පිට
කොළඹ 05

විද්‍යුත් තැපැල් :- labourhrddivision@gmail.com

**වැඩි විස්තර සඳහා :-**
දු.ක. :- 011-2104828, 011-2104829, 011-2104830